---

ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ ඔපෙක් අරමුදල අතර 2013 ජුනි 10 දින එළඹි අංක 15111පීබී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ජාතික මාර්ග 13 ක කිලෝමීටර් 65.45 ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 12,347.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99 ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57 කට සමාන එ.ජ.ඩො මිලියන 50 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවිධානය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 5,847.80 කට සමාන එ.ජ.ඩො මිලියන 44.99 ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය එකගවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කල මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කරන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------- | ---------- | -------------- | ---------- |
| (අ) | 2019 වර්ෂයේදී ඔපෙක් අරමුදලෙන් ව්‍යාපෘතියට එකතුව රු.මිලියන 799.91ක් සපයා තිබුණද එකතුව | 2019 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ දැක්වෙන මුළු ණය මුදල රු. මිලියන | 2019 වර්ෂය සඳහා මුළු මුදල් ලබා දීමේ රු.799,914,345.23 විය. කෙසේවෙතත්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව මුළු ණය මුදල් ලැබීම් සහ |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 285.57 ක් පමණක් ණය ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඉතිරි මුදල වන රු.මිලියන 514.34 ක් ලැබියයුතු විදේශ අධාර ලෙස වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණි. | 514.34 කින් අඩුවෙන් දැක්වේ. | වර්ෂය සඳහා රු.285,575,146.53 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. එම නිසා ව්‍යාපෘතිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සපයන ලද ණය මුදල ලෙස රු.285,575,146.53 ක් ගිණුම්ගත කර තිබුණු අතර ඉතිරි මුදල වූ 514,339,198.70 ක් 2019 වර්ෂය සඳහා ලැබිය යුතු විදේශාධාර ලෙස ගිණුම්ගත කර තිබුණි. | ණය මුදල දැක්වීමට නියමිත පරිදි වාර්තා පවත්වා ගැනීමට අවශය වේ. |
| (ආ) | ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය, කොට්ටාව-තලගල මාර්ගය සහ කොට්ටාව-බෝපේ මාර්ග සඳහා ජුනි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා පිළිවෙලින් අන්තර් ගෙවීම් සහතික අංක 09, 32 සහ 35 අදාලව ගෙවිය යුතු රු.මිලියන 60 ක් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගිණුම්ගත කර නොතිබුණි. | කෙරීගෙන යන වැඩ සහ ජංගම වගකීම් ගිණුම් අඩුවෙන් දැක්වේ. | ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය, කොට්ටාව-තලගල මාර්ගය සහ කෝට්ටේ - බෝපේ මාර්ගවලට අදාල අන්තර් ගෙවීම් සහතික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු PMU වෙත ලැබී තිබුණි. එම නිසා ඉහත අන්තර් ගෙවීම් සහතික 2020 වර්ෂයේදී ගිණුම්ගත කරනු ලැබේ. | වාර්තා කරන දිනට නිවැරදි මූල්‍ය තත්ත්වය ප්‍රකාශයක් දැක්වීමට නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | කොට්ටාව-තලගල මාර්ගය සහ කෝට්ටේ - බෝපේ මාර්ග, වල්ගම-දියගම මාර්ගය සහ මහරගම පිළියන්දල මාර්ග සඳහා රු.මිලියන 2,242ක වන්දි මුදලක් නිරවුල් කිරීමේ ප්‍රමාදයට අදාල ආසන්නව රු.මිලියන 569 ක ගෙවිය යුතු පොළිය 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවිය යුතු වන්දි මුදල් අඩුවෙන් දැක්වීම. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වන්දි සඳහා පොළිය උපචිත කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි බව තහවුරු කර ගැනීමට ගිණුම්කරන ප්‍රමිති නිවැරදිව භාවිතා කල යුතු වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබදව භෞතික ප්‍රගතිය

| | සංරචකය | 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | 2019 දෙසැම්බර් 31 දිනට අත්කරගත් කාර්යසාධනය | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | කොට්ටාවා-තලගල මාර්ගය | 85.6% | 54.3% | අපේක්ෂිත ප්‍රගතියට පිටුපසින් තත්‍ය ප්‍රගතිය පැවතුණි. | කටයුතු ප්‍රමාදයන් සහිතව නිම කිරීමට සහ ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමට ඉඩ ඇත. | -එකගවේ- ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නල එලීමේ කටයුතුවල ප්‍රමාදය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට දින 175ක කාල දීර්ඝ කිරීමක් ලබා දී ඇත. | ඉලක්කගත දිනයන්ට මාර්ග ඉදි කිරීම් කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | කෝට්ටේ - බෝපේ මාර්ග | 70.12% | 98.3% | | | | |
| (ඇ) | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය | 100% | 28.76% | | | | |
| (ඉ) | අනෙකුත් මාර්ග 4ක 17.47 Km ක ඉදිකිරීමේ කටයුතු | 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිත විය. | නොමැත | කටයුතු ආරම්භ කර නොතිබුණි. | -එම- | | -එම- |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | රු.මිලියන 6,499.57 කට සමාන එ.ජ.ඩො මිලියන 50 කින් 2019 දෙසැම්බර් 31 දිනට සියයට 50.79 ක් නියෝජනය කරන රු.මිලියන 3,301 කට සමාන එ.ජ.ඩො මිලියන 23.83 ක් පමණක් උපයෝජනය කර තිබුණි. කටයුතුවල භෞතික ප්‍රගතිය සහ අරමුදල් උපයෝජනයේ මන්දගාමී බව හේතුවෙන් 2017 දෙසැම්බර් | ණය පහසුකම් ඉකුත්වීමට පෙර මුළු ණය මුදල උපයෝජනයට නොහැකි වේ. | එකගවේ | ණය කාලසීමාව අවසන්වීමට පෙර වෙන් කරන ලද මුදල් උපයෝජනයට මූල්‍ය සැලැස්ම තදින් අධීක්ෂනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 31 දින අවසන් වීමට නියමිතව තිබුණු ණය මුදලේ කාලසීමාව 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. | | | |
| (ආ) | ලැබී තිබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය කොට්ටාව-තලගල මාර්ගය සහ කෝට්ටේ - බෝපේ මාර්ගයේ සහ ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය දෙපස ගස් 2,850 ක් ඉවත් කිරීමට රු.මිලියන 18.7 ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ස්ථාන 3ක නව ගස් 254ක් නැවත සිටුවීම සඳහා වැඩසටහන් 3ක් පමණක් සිදු කර තිබුණි. | පරිසරයට හානි සිදුවීම | අත්පත් කරගත් ඉඩම් මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණවත් වූ අතර ගස් සිටුවීම සඳහා ස්ථාන කිහිපයක් පමණක් ඉතිරිවී තිබුණි. | පරිසරයට සිදුවන හානිය පූර්ණය කිරීමට ගස් නැවත සිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ. |

**3.3 ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබද ගැටළු**

| | විගණන ගැටළු | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------ | --------- | ---------------- | ---------- |
| (අ) | ලැබී තිබුණු තොරතුරු අනුව, ඉඩම් කොටස් 5,599 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. එයින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වැනි වගන්තිය යටතේ ඉඩම් කොටස් 2,295 ක වන්දි මුදල් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කොටස් 5ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 25ක මුදලක් පොළී ගෙවා තිබුණු අතර අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.මිලියන 1,379 ක වන්දි ගෙවීමේ වවුචර්පත් ව්‍යාපෘතිය සතුව පැවතුණි. | වන්දි මුදල් නිරවුල් කිරීම මත පොළිය සඳහා අමතර පිරිවැයක් දැරීමට ඉඩ ඇත. | -එකගවේ-<br>ඉඩම් අත්පත් කර ගැනීමට වන්දි ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් වෙන් කර නොතිබුණි. | ඉලක්කගත හා දිනයන්ට නිමකිරීමට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු වේ. |
| (ආ) | කොට්ටාව-තලගල මාර්ගයේ 14.48Km ඉදිකිරීම් කටයුතු 2017 පෙබරවාරි 20 දින ආරම්භ කර | ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමට ඉඩ ඇත. | එකගවේ. | ව්‍යාපෘතියේ අමතර පිරිවැය අවම කර ගැනීම සඳහා ඉඩම් |

| | |
|---|---|
| තිබුණද ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2020 අගෝස්තු 31 දින වන විටත් 5.44 Km ක් කොන්ත්‍රාත්කරු වෙත භාරදී නොතිබුණි. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් කෝට්ටේ - බෝපේ මාර්ගය සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 56ක් දීර්ඝ කිරීම් පිරිවැයක් ඉල්ලා තිබුණි. | අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වේ. |